# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.25 පැය 1500 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1885/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**විශේෂ රථවාහන මෙහෙයුම සම්බන්ධව - රථවාහන මූලස්ථානය.**

උත්සව සමයේ රථවාහන අනතුරු අවම කර ගැනීමේ අරමුණින් වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි විශේෂ රථවාහන මෙහෙයුමක් 2024.12.20 වන දින සිට දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත.

2024.12.24 වන දින පැය 0600 සිට 2024.12.25 වන අද දින පැය 0600 න් අවසන් වූ පැය 24 ක කාලය තුල විශේෂ රථවාහන මෙහෙයුම මඟින් බීමත් රියදුරන් 251 දෙනෙකු අපරීක්ෂාකාරී හා අන්තරාදායක ලෙස රිය පැදවීමට අදාල රියදුරුන් 81 දෙනෙකු, අධික වේගයෙන් රිය පැදවීම සම්බන්ධව රියදුරන් 128 දෙනෙකු මාර්ග නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රියදුරන් 1368 ක්, බලපත්‍ර වැරදි සම්බන්ධ රියදුරන් 615 ක් සහ වෙනත් රථවාහන වැරදි සම්බන්දයෙන් රියදුරන් 6304 ක් ද ඒ අනුව සමස්ත රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 8747 ක් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර ඇත.

2024.12.24 වන දිනය තුල දිවයිනේ කිසිදු මාරක රිය අනතුරක් සිදු වී නොමැති බැවින් රිය අනතුරු වළක්වා ගැනීම සඳහා මාර්ග නීති පිළිපදිමින් රථවාහන ධාවනය කරන ලෙස ශ්‍රී ලංකා පොලිසිය රියදුරන්ගෙන් ඉල්ලා සිටින අතර මෙම මෙහෙයුම තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**